ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
ආයතනික අධ්‍යයන දෙපාර්තමේන්තුව
විද්‍යාවේදී / අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව
තුන්වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2025
ඔබගේ කාර්යය සහ මිනිසුන් කළමනාකරණය කිරීම - MSU3208/OSU3208
කාලය : පැය (02) දෙකයි

දිනය : 2025 දෙසැම්බර් 29	වේලාව : ප.ව.01.30 - ප.ව.03. 30

උපදෙස්

- ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.
- පිළිතුර විධිමත් ලෙස අදාළ ප්‍රශ්නයට කේන්ද්‍රගත කළ යුතුය.

01. (අ) 'කළමනාකරණය'(Management) යනු කුමක්දැයි ඔබේම වචනවලින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ආ) ව්‍යාපාර සංවිධානයක 'ඉලක්ක' සහ 'අරමුණු' අතර වෙනස දක්වන්න. (ලකුණු 06)
(ඇ) සංවිධාන පරිසරය සංවිධානයක ක්‍රියාකාරිත්වයට බලපාන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(ඈ) හෙන්රි ෆයෝල් විසින් සංවර්ධනය කරන ලද 'කළමනාකරණයේ මූලධර්ම 14', ඵලදායී කළමනාකරණ පිළිවෙත් සඳහා මාර්ගෝපදේශ මාලාවකි. ඔබ කැමති කළමනාකරණ මූලධර්ම පහ (05)ක් පැහැදිලි කරන්න. (ලකුණු 10)

02. (අ) සැලසුම් කිරීම (Planning) යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ආ) "සැලසුම් කිරීම ඉතා වැදගත් වුවත්, සමහර කළමනාකරුවන් එය නොකිරීමට තෝරාගන්නේ ඇයි?" පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ඇ) සංවිධාන සටහනක (Organizational Chart) ප්‍රතිලාභ පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ඈ) ජෙනුස් ටෙක්ස්ටයිල්ස් සමාගම ශ්‍රී ලංකාවේ මධ්‍යම ප්‍රමාණයේ ඇඟලුම් නිෂ්පාදකයෙකි. සමාගම පුළුල් වන විට, එහි කළමනාකාරිත්වය සම්බන්ධීකරණය, කාර්යක්ෂමතාව සහ තීරණ ගැනීම සම්බන්ධයෙන් අභියෝගයන්ට මුහුණ දීමට සිදුවිය. මෙහෙයුම් විධිමත් කිරීම සඳහා, ප්‍රධාන විධායක නිලධාරියා දෙපාර්තමේන්තුකරණයේ විවිධ පදනම් භාවිතා කරමින් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට තීරණය කළේය. ඔබ ජෙනුස් ටෙක්ස්ටයිල්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා යැයි උපකල්පනය කරන්න, සුදුසු පරිදි සමාගම සඳහා දෙපාර්තමේන්තුකරණයේ පදනම් හතරක් (04) යෝජනා කරන්න. (ලකුණු 10)

03. (අ) 'අනුහස් නායකයෙක් '(Charismatic Leader) යනු කවරෙක් ද ? සැබෑ ලෝකයේ උදාහරණ භාවිතා කර පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ආ) 'නායකත්වයේ ලක්ෂණ න්‍යාය' (Trait Theory of Leadership) යටතේ හඳුනාගත් පුද්ගලික ලක්ෂණ තුන (03) ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ඇ) රැකියා ස්ථානයේ මිනිසුන් අභිප්‍රේරණය කළ යුත්තේ ඇයි? හේතු තුනක් (03) ක් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඈ) ඔබේ උපාධි වැඩසටහනේ 3 වන මට්ටමේ විභාග සම්පූර්ණ කිරීමෙන් පසු කුඩා ඖෂධ පැළෑටි නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔබ අපේක්ෂා කරන බව උපකල්පනය කරන්න. ඔබේ ව්‍යාපාරය ආරම්භ කිරීමේදී හොඳ තීරණ ගැනීම වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

04. (අ) "සන්නිවේදන ක්‍රියාවලිය"(Communication Process) යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ආ) ඵලදායී සන්නිවේදනයට බලපාන ප්‍රධාන සාධක හතර (04) ක් විස්තර කරන්න. (ලකුණු 06)

(ඇ) කළමනාකරුවෙකුට අවශ්‍ය වන, අත්‍යවශ්‍ය සන්නිවේදන කුසලතා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ඈ) වර්ධනය වන සමාගමකට ඵලදායී මානව සම්පත් සැලසුම්කරණය (HRP) ශ්‍රම බලකායේ අභියෝග කළමනාකරණය කිරීමට උපකාරී වන්නේ කෙසේද? සුදුසු උදාහරණ සමඟ ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 10)

05. පහත සඳහන් දෑ පිළිබඳව කෙටි සටහන් ලියන්න

අ) කළමනාකරණ විද්‍යා ප්‍රවේශය (Management Science Approach) (ලකුණු 05)
ආ) සමාජ වගකීම (Social Responsibility) (ලකුණු 05)
ඇ) මෙහෙයුම් කළමනාකරණය (Operations Management) (ලකුණු 05)
ඈ) සන්නිවේදන ජාලය (Communication Network) (ලකුණු 05)
ඉ) පාලන ක්‍රියාවලිය (Controle Process) (ලකුණු 05)

(ලකුණු 05 x 05 = මුළු ලකුණු 25)

- නිමිකම් ඇවිරිණි -